2.2	පුද්ගල පඩිනඩි ලේඛණ / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ	-	-
2.3	විගණන විමසුම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ	-	-
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS)පිළියෙලකර නියමිත දිනට මහාභාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූලවේ	-	-
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලවේ	-	-
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ	-	-
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ	-	-
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ	-	-
2.11	උප පත්‍රිකා ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ	-	-
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මූ.රෙ.135)-**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුල බලතල පවරාදී තිබීම	අනුකූලවේ	-	-

3.2	මූල්‍ය බලතල පවරාදීම පිලිබඳ ආයතනය තුල දැනුවත්කර තිබීම	අනුකූලවේ	-	-
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූලවේ	-	-
3.4	2014.05.11 දිනැති අංක 171 / 2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවර යන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූලවේ	-	-
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ	-	-
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	-	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	-	-	-
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූලවේ	-	-
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ	-	-
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූලවේ	-	-
06	**අභ්‍යන්තර විගණනය**		-	-
6.1	මූ.රෙ. 134(2) DMA /1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම	අනුකූලවේ	-	-
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ	-	-
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ	-	-

07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුල පවත්වාගෙන තිබීම	02ක් පවත්වා ඇත	-	-
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිලිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත්කර තිබීම	අනුකූලවේ	-	-
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13වන පරිච්ඡේදය , ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර තිබීම	අනුකූලවේ	-	-
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම	අනුකූලවේ	-	-
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම	අනුකූලවේ	-	-
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මූ.රෙ. 772 අනුව සිදුකිරීම	අනුකූලවේ	-	-

09	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූලවේ	-	-
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූලවේ	-	-
9.3	වාහන ලොග් පොත් පවත්වාගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ	-	-
9.4	සෑම වාහන අතතුරක් සම්බන්ධයෙන්ම මූ.රෙ. 103, 104,109,හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූලවේ	-	-
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය නැවත පරීක්ෂා කිරීම	අනුකූලවේ	-	-
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලෝග්පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූලවේ	-	-
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ	-	-
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූලවේ	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළයුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූලවේ	-	-
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූලවේ	-	-
11.2	මූ.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැර කම් වලට එලඹීම	අනුකූලවේ	-	-

12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූලවේ	-	-
12.2	හිඟ හිටි ණය ශේෂ පිලිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූලවේ	-	-
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූලවේ	-	-
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මූ.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූලවේ	-	-
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ	-	-
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූලවේ	-	-
14.2	මූ.රෙ. 371 ප්‍රකාරව නිකුත්කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූලවේ	-	-
14.3	මූ.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත්කර තිබීම	අනුකූලවේ	-	-
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූලවේ	-	-
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස්කළ අදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	-	-	-
15.2	රැස්කර තිබූ අදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම අදායමට බැර කර තිබීම	-	-	-
15.3	මූ.රෙ. 176 අනුව හිඟ අදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	-	-	-
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්යමණ්ඩල සීමාව තුල කාර්යමණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ	-	-
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-

17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
17.2	ආයතනය පිලිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දි තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිලිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පලකිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ	-	-
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05 /2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි /සේවා ලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ	-	-
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි /සේවා ලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රම වේදනයක් සකස් කොට තිබීම	අනුකූල වේ	-	-
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.1.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස්කොට තිබීම	අනුකූල වේ	-	-
19..2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කර තිබීම	අනුකූල වේ	-	-
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්යමණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ	-	-

19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිලිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කර තිබීම	අනුකූල වේ	-	-
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	-	-	-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඒආර්අයි/ එන්/එල්යූපීපීඩී/2/22/13 මගේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 මැයි/ 10 දින

ගණන්දීමේ නිලධාරී

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

ශීර්ෂය 327 - ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 327 - ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

මු.රෙ. 50 (ii) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කර, එම ඇස්තමේන්තු පදනම් කරගත් වාර්ෂික ක්‍රියාකාරී සැලසුමකට අනුව නිසි වැඩ පිළිවෙලක් යටතේ වියදම් කල යුතු වේ. එසේම සමාලෝචිත වර්ෂයේ රජයේ වියදම් සීමා කිරීම් කරන ලෙස 2022 සැප්තැම්බර් මස 09 දිනැති 2022 අංක 21 දරන විසර්ජන (සංශෝධන) පනතින් අයවැය සංශෝධනය කර නිවැරදි ඇස්තමේන්තු පිළියෙළ කරගෙන තිබුණද මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම්වල ගොඩනැගිලි සහ ඉදිකිරීම් (2001) වැය විෂයෙහි ඉතිරිය රු.2,694,712 සහ හැකියා වර්ධනය යටතේ කාර්ය මණ්ඩල පුහුණු (2401) යන වැය විෂයෙහි ඉතිරිය රු.1.262,166 විය. එය පිළිවෙලින් සියයට 67 ක් සහ සියයට 63 ක අගයක් ගෙන තිබුණි.

2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

(අ) මුදල් රෙගුලාසි 94 අනුව වාර්ෂික ඇස්තමේන්තුවල මුදල් ප්‍රතිපාදන සලසා ඇත්නම් විනා වැඩක්, සේවාවක් සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට හෝ නොබැඳී සිටිය යුතු වේ. එසේම 2017 අප්‍රේල් 22 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2(ඇ) ඡේදය අනුව යම් මුදල් වර්ෂයකට අදාළ සියලුම බැරකම් එම වර්ෂය තුළදී මුදල් ගෙවා නිදහස් කල යුතු අතර, කිසිදු බැරකමක් ඊළඟ මුදල් වර්ෂය තුළ නිරවුල් කිරීමේ අරමුණ ඇතුව ඉදිරියට ගෙන නොයා යුතු බවට උපදෙස් දී තිබියදීත් දෙපාර්තමේන්තුව විසින් වැය විෂයන් 02 කට අදාළව වාර්ෂික ප්‍රතිපාදනයන් ඉක්මවා රු.257,785 ක බැරකම්වලට එළඹී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ බැඳීම් හා බැරකම් ලේඛණයේ සඳහන් වූ එකතුව රු. 325,139 ක් වූ වියදම් 2023 වර්ෂයේ ප්‍රතිපාදනවලින් වැය කර ඇතත් ඒවා මූල්‍ය ප්‍රකාශනවල බැරකම් ලෙස හඳුනාගෙන නොතිබීම හේතුවෙන් එම වටිනාකමෙන් බැරකම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ වැය විෂයන් 04 කට අදාලව රු.263,131 ක්වූ බැරකම්වල වටිනාකමට අදාලව නිරවුල් කිරීම් දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශය විසින් පවත්වාගෙන යන බැඳීම් හා බැරකම් ලේඛණයෙන් තහවුරු නොවීය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන කට්ටලයේ ඇතුළත් බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ බැරකම් 05 කට අදාළව වැය විෂයන් වැරදි ලෙස දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයට අනුව බැරකම් 101 ක මුළු වටිනාකම රු.1,636,170 ක් වුවත් භාණ්ඩාගාර මුද්‍රිත SA-92 අනුව එය බැරකම් 11ක් සඳහා රු. 1,197,492 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව භාණ්ඩාගාර මුද්‍රිතයන්හි ඇතුළත් නොවූ බැරකම් වටිනාකම රු. 438,678 ක් විය.

(ඊ) බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුළත් බැරකම් 101න්, 1101 වැය විෂයට අදාළ රු. 4,200 ක් වූ එක් බැරකමක් පමණක් භාණ්ඩාගාර මුද්‍රිත සටහනෙහි පෙන්වන අතර, භාණ්ඩාගාර මුද්‍රිත සටහනෙහි දක්වා ඇති මුළු වටිනාකම රු. 1,193,292 ක් වූ බැඳීම් හා බැරකම් 10 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් වී නොතිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	**අනුකූල නොවීම**
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
i. මුදල් රෙගුලාසි 137	එකතුව රු. 35,000 වටිනා වවුවර් පත් 02 ක් අනුමත කරන නිලධාරියාගේ අත්සන නොමැතිව ගෙවීම් කර තිබුණි.
ii. මුදල් රෙගුලාසි 225 (1)	සියලුම ගෙවීම් වවුවර් නියමිත ආකෘති පත්‍රවල නිවැරදිව සම්පූර්ණ ලෙස පුරවා ගෙවීම් සඳහා ඉදිරිපත් කළ යුතු වුවද පරීක්ෂා කරන ලද සියලුම වවුවර්පත්වල වියදම් සහතික කරන නිලධාරියාගේ පදවිය සඳහන් කර නොතිබුණි.
iii. මුදල් රෙගුලාසි 225 (4)	වවුවරය නිවැරදි සහ සෑම විස්තරයක් අතින්ම සම්පූර්ණ බවට සහතික කරන නිලධාරි අත්සන් කර තිබුණ ද 2022 ජනවාරි 01 දින සිට ඔක්තෝබර් 31 දින දක්වා එකතුව රු.55,385 ක් වටිනා වවුවර්පත් 05 ක අකුරෙන් සහ ඉලක්කමෙන් දක්වන වටිනාකම් නිවැරදිව සඳහන් කර නොතිබුණු අතර වවුවරයේ කෙටි අත්සන තැබිය යුතු වුවත් එකතුව රු. 736,364 වටිනා වවුවර් පත් 18 ක පරීක්ෂා කරන නිලධාරියාගේ කෙටි අත්සන නොතිබුණි.
iv. මුදල් රෙගුලාසි 232 (2)	වවුවරයට හෝ සාරාංශයට හෝ අඩංගු මුදල අකුරෙන් මෙන්ම ඉලක්කම්වලින්ද සටහන් කළ යුතු වුවද එකතුව රු. 447,419 වටිනා වවුවර් පත් 13 ක මුදල අකුරින් ලියා නොතිබුණි.
v. මුදල් රෙගුලාසි 392 (ඇ) (iii)	මුදල් පොතෙහි අවලංගු කළ චෙක්පතට අදාළ මුල් සටහන ඉදිරියෙන් රතු තීන්තෙන් සුදුසු සටහනක් යෙදිය යුතු වුවද එසේ සිදු කර නොතිබුණි.
vi. මුදල් රෙගුලාසි 1645 (අ)	වාහන භාර නිලධාරියා විසින් එක් එක් වාහනය වෙනුවෙන් ලොග් සටහන් පොත් යාවත්කාලීනව තබා ඇති බවට

		වගබලා ගත යුතු වුවද, දෙපාර්තමේන්තුව සතු වාහන සම්බන්ධයෙන් එම ලොග් පොත් අඩුපාඩු සහිතව පවත්වා තිබූ බව නිරීක්ෂණය විය. විගණනයේදී නියැදි පරීක්ෂා කරන ලද අංක PK- 7050, PE - 1685 සහ JV - 1497 දරන වාහන වෙනුවෙන් පවත්වන ලොග් පොත් වල වාහනය පිළිබඳ විස්තර පිටුවෙහි වාහන මූලික විස්තර, දැවෙන ඉන්ධන ප්‍රමාණය, වාර්ෂික ආදායම් බලපත්‍ර පිළිබඳ විස්තර, අයිතිය පැවරීම, හදිසි අනතුරු, රියදුරන් මාරු කිරීම, ගමන් පිළිබඳ මාසික සාරාංශ වැනි තොරතුරු ඇතුළත් කර නොතිබුණි.
(ආ)	2022 දෙසැම්බර් 13 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක: 2022/05 හි 3.2	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය සහ භාණ්ඩාගාර මුද්‍රිත SA - 52 අනුව සැසඳීමේදී මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි අත්තිකාරම් ගිණුම් ලැබීම් සහ ගෙවීම් ලෙස පිළිවෙලින් රු. 17,775,377 ක් සහ රු. 12,065,063 ක් වූ අතර, එය භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු. 19,276,457 ක් සහ රු. 13,555,630 ක් විය. ඒ අනුව හරස් සටහන් මඟින් අත්තිකාරම් ලැබීම් සහ ගෙවීම් වටිනාකම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි ඇතුළත් නොකිරීම නිසා අත්තිකාරම් ලැබීම් රු. 1,501,080 කින්ද, අත්තිකාරම් ගෙවීම් රු. 1,490,567 කින් ද අඩුවෙන් දක්වා තිබුණි.
(ඇ)	2022 දෙසැම්බර් **13** දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක : 2022/05 හි 7.10	ඒසීඒ-**7** ආකෘතිය අනුව දෙපාර්තමේන්තුව අග්‍රිම සැසඳුම් ප්‍රකාශය පිළියෙල කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ ගණනය කිරීම් අනුව ශේෂය රු. 43,017,700 ක් වුවත් විගණනයට අනුව එම ශේෂය රු. 43,007,187 ක් විය. ඒ අනුව අග්‍රිම ගිණුම් ප්‍රකාශයේ ශේෂයන්හි වෙනස රු. 10,513 ක් බව විගනනයේදි නිරීක්ෂණය විය.
(ඈ)	මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2018 ඔක්තොබර් 10 දිනැති අංක 03/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 4 ඡේදය	2019 මාර්තු 31 දිනට පෙර දෙපාර්තමේන්තුව භාවිතා කළ වාහනවල අයිතිය පවරා ගැනීම සම්බන්ධයෙන් වන ගැටළු නිරාකරණය කර ගැනීමට කටයුතු කළ යුතු වුවත්, වරින්වර අදාළ අමාත්‍යාංශය වෙනස්වීම සහ කොම්ප්ට්‍රොලර් ජනරාල් විසින් කල්බදු ක්‍රමය යටතේ ලබා ගෙන ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් නමට ලබා දී ඇති වාහනවල අයිතිය කල්බදු

අවසන්ව ලංකා බැංකුව විසින් ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වෙත පවරා දී නොමැතිවීම යන හේතු නිසා රු.7,700,000 ක් වටිනා වාහන 02ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද දෙපාර්තමේන්තුව නමින් ලියාපදිංචි කර නොතිබුණි.

2.3 බැංකු ගිණුම් මෙහෙයවීම

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවීම් කර ඇතත් බැංකුවට ඉදිරිපත් නොවූ ලෙස දක්වා ඇති රු.6,380,684 ක් වටිනා චෙක්පත් 113 ක් ගිණුම් අංශයෙන් අදාල පුද්ගලයින් හෝ ආයතන වෙත භාරදීමට කටයුතු කර තිබුණේ 2023 ජනවාරි 03 සිට පෙබවාරි 28 දක්වා වූ කාලය තුළ දීය.ඒ අනුව ඒවා වැඩ කරන දින 02ත් 24ත් අතර කාලයක් ගිණුම් අංශය තුළ පැවති බව විගණනයේදී නිරීක්ෂණය විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 දැක්ම හා මෙහෙවර

දෙපාර්තමේන්තුවේ දැක්ම "ශ්‍රී ලංකාවේ භූමි සම්පත් ප්‍රශස්ත හා තිරසාර ලෙස කළමනාකරණය කිරීම" වන අතර, මෙහෙවර "පාරිසරික සමතුලිතතාවය පවත්වා ගනිමින් තිරසාර සහ ප්‍රශස්ත ලෙස භූමිය පරිහරණය කිරීමට ප්‍රතිපත්ති සම්පාදනය සහ සැලසුම් සකස්කර ක්‍රියාත්මක කිරීමට සහායවීම" වේ. ඒ වෙනුවෙන් 2007 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සංශෝධනයට 2018 අගෝස්තු මාසයේදී අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව ප්‍රධාන කාර්යයක් වන ශ්‍රී ලංකාව සඳහා ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සකස්කිරීම සහ කාලීන අවශ්‍යතාවයන් අනුව එය සංශෝධනය කිරීමට සකස් කල අවසන් කෙටුම්පත ඉඩම් හා සංවාරක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණද ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සැකසීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

3.1.2 සැලැසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම 2022 ජනවාරි 19 දින ගණන්දීමේ නිලධාරි විසින් මාසයක කාල පමාවකින් පසු අනුමත කර ඇතත් ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

(අ) අංක PF-7635 දරන රථයෙහි රු. 139,407 ක අලුත්වැඩියාව සඳහා 2022 ජූනි 03 දාතම යෙදූ ෆර්ෆෝමා ඉන්වොයිසියක් මත පදනම්ව යුනයිටඩ් මෝටර්ස් ලංකා පී එල් සී වෙත ගෙවීම් කිරීමේදී ඒ සඳහා බලයලත් පුද්ගලයෙකුගේ අනුමැතිය ගෙන නොතිබුණි.

(ආ) අංක PK-7040 රථය 2022 පෙබරවාරි 03 දින රු. 52,241ක් වැය කර ආරක්ෂිත ස්ටිකර් ඇලවීම හා අංක PD-6295 රථයට 2022 ජනවාරි 20 දින පිටුපස බ්‍රේක් වොෂර් සවිකර ඒ සඳහා රු. 4,200ක් වැය කර ඇතත්, අදාළ මෝටර් රථ 02 ක එම ගරාජයන් වෙත රැගෙන යාම දෛනික ධාවන සටහන්වලින් සනාථ වී නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ තක්සේරු වටිනාකම රු.331,250 ක් වූ උපකරණ අයිතම 29ක් රු. 25,965 කට වෙන්දේසි කර ඇතත් ඒවා තක්සේරු කිරීමේදී වර්තමාන අගය මත පදනම්ව තක්සේරුව සිදු කළ බවට විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. එනම්,එම උපකරණවල තක්සේරු වටිනාකම හා වෙන්දේසි වටිනාකම අතර රු. 305,285 ක වෙනසක් වීම හේතුවෙන් තක්සේරු වටිනාකමින් 8% ක් වැනි අඩු අගයක් වීම තක්සේරු කිරීමේ දෝෂයක් හෝ විකුණුම් ක්‍රියාවලියේ දෝෂයක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඈ) FAO ආයතනය විසින් 2022 පෙබරවාරි 02 දින ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවට GPS යන්ත්‍ර 03ක් පරිත්‍යාග ලෙස ලබා දී ඇති නමුත් එම යන්ත්‍ර 03හි වටිනාකම තක්සේරු කර වත්කම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

3.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

මුදල් රෙගුලාසි 880 (i) ප්‍රකාරව රජයේ ගිණුමට අදාළ වවුචර සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරි කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව හා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ අංක PFD/RED/01/01/2020/01 හා 2020 අගෝස්තු 28 දිනැති 01/2020 චක්‍රලේඛයේ 9.1 වගන්තියෙහි අදාළ විධිවිධාන යටතේ ඇප තැබිය යුතු බව තවදුරටත් අවධාරණය කර තිබියදී දෙපාර්තමේන්තුව විසින් එසේ ඇප තැන්පත් කළ යුතු නිලධාරීන් හඳුනාගෙන ඇප තැන්පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

3.4 පාඩු හා හානි

PD – 6295 වාහනයෙහි අනතුරක් හේතුවෙන් දරන ලද රු. 5,923 ක වියදම ශ්‍රී ලංකා රක්ෂණ සමාගම මගින් 2021 පෙබරවාරි 10 දින ප්‍රතිපූරණය කර ගෙන ඇතත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සටහන් (ii) හි පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශයෙහි මෙම වාහනය අනතුරට පත්වීම සම්බන්ධයෙන් ආරම්භක කපා නොහළ ශේෂයක් ලෙස රු. 3,798 ක්

පෙන්වන අතර එහි අලාභයේ වටිනාකම රු. 9,720 ක් ලෙස සාවද්‍ය ලෙස පෙන්වා තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

4 යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව දෙපාර්තමේන්තුව සඳහා 2022 පෙබරවාරි 01 දින සිට අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබුණි.

4.2 විගණන හා කළමනාකරණ කමිටුව

කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක - DMA/1 – 2019 අනුව, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට එක බැගින් වර්ෂයකට 04 ක් වන පරිදි පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

දෙපාර්තමේන්තුව සඳහා අනුමත සේවක සංඛ්‍යාව 697 ක් වන නමුත්, තථ්‍ය සංඛ්‍යාව 620 ක් වූ අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 21 ක්, තෘතීයික මට්ටමේ පුරප්පාඩු 1 ක්, ද්විතීයික මට්ටමේ පුරප්පාඩු 36 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 19 ක් සමඟ මුළු පුරප්පාඩු 77 ක් පැවතියද, සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාවේ සඳහන් කර ඇති පරිදි ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස තථ්‍ය නිමැවුම සියයට 75 ත් සියයට 100 ත් දක්වා පරාසයක තිබුණු බැවින් අනුමත සේවක සංඛ්‍යාවන් පිළිබඳව නැවත සමාලෝචනයක් සිදු කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

පී.කේ.එම්.පී. නෝනිස
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

පී.කේ.එම්.පී.නෝනිස්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට